## පළමුවන කියැවීම

යෙසායා 40:1-5, 9-11

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**සමිඳුන්ගේ තේජාලංකාරය එවිට එළිදරව් වන්නේ ය. සකල මිනිස් වර්ගයා එය නරඹන්නෝ ය.**

"සනසන්න, මාගේ සෙනග සනසන්නැ"යි ඔබේ දෙවිඳාණෝ වදාරණ සේක. "කරුණාවෙන් ජෙරුසලම් වැසියන්ට කතා කරන්න; හඬ නගා ඔවුන්ට මෙසේ කියන්න. ඔවුන්ගේ වහල්කමේ කාලය දැන් ඉවරවී ඇත; පව් කමාව ඔවුන්ට ලැබී ඇත. සියලු පව් වලට දඬුවම් දෙගුණය බැගින් සමිඳුන්ගේ හස්තයෙන් ම ඔවුන්ට ලැබී ඇත." මෙසේ කියන හඬට සවන් දෙන්න. "වනාන්තරයේ සමිඳුන් හට මාවතක් එළි කරන්න; පාළුකරයේ අපේ දෙවිඳුන් හට මහ පාරක් සාදන්න. සියලු මිටියාවත් පුරවනු ලබන්නේ ය; සියලු කඳු හෙල් කපා පහත් කරනු ලබන්නේ ය; සියලු හෙල් සමතලා කරනු ලබන්නේ ය. රළු තැන් සුමුදු කරනු ලබන්නේ ය. සමිඳුන්ගේ තේජාලංකාරය එවිට එළිදරව් වන්නේ ය. සකල මිනිස් වර්ගයා එය නරඹන්නෝ ය. මෙසේ වදාළේ සමිඳාණෝම ය." සියොන්ට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි, උස් කන්දට නගින්න. සියොන්ට සුබ ආරංචිය දන්වන්න. ජෙරුසලමට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි, හඬ නගා ප්‍රකාශ කරන්න; බිය නොවී උස් හඬින්, "ඔබේ දෙවිඳාණෝ වඩින සේකැ"යි ජුදාහි නගරවලට ප්‍රකාශ කරන්න. මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ බලපරාක්‍රමයෙන් වඩින සේක. වික්‍රමයෙන් පාලනය කරන්න වඩින සේක. ත්‍යාගයන් එතුමාණෝ තමන් සමග ගෙන එන සේක. තම සෙනගට විපාකයන් ප්‍රදානය කරන සේක. එඬේරෙකු සේ එතුමාණෝ තම රැළ පෝෂණය කරන සේක; දෑතින් බැටළු පැටවුන් වඩාගෙන, ළයෙහි උන් හොවාගෙන යන සේක. කිරිදෙන බැටළු දෙනුන්ට මග පෙන්වන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 104:1-4, 24-25

පිළිතුර: මාගේ සිත සමිඳුන් පසසන්න.

ගීය: මාගේ සිත සමිඳුන් පසසන්න. මාගේ දෙවි සමිඳුනි, ඔබ ඉතා උතුම්ය. ඔබ තෙද මහිමයෙන් සැරසී සිටින සේක. ඔබ ලෝකය නැමති වස්ත්‍රය හැඳ පැළඳ සිටින සේක. වියනක් මෙන් අහස විහිදා ලන සේක.

ඔබේ මාළිගාව ඉහළ දිය කඳ මත පිහිටුවන සේක. වලාකුළු ඔබේ රිය කරගන්න සේක. සුළඟ ඔබේ දූතයන් ද ගිනි දලු ඔබේ සේවකයන් ද කරගන්න සේක.

සමිඳුනි, ඔබේ කර්මාන්ත කොපමණ විවිධාකාර ද? ඔබ සියල්ල ප්‍රඥාවෙන් මැවූ සේක. පොළොව ඔබ මැවූ සතුන්ගෙන් පිරී ඇත. අර තිබෙන්නේ සුවිසල් සාගරය! එහි ලොකු කුඩා සත්වයෝ ගණන ඉක්මවා සැරිසරති.

## දෙවන කියැවීම

තීතස් 2:11-14; 3:4-7

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තීතස්ට ලියන ලද හසුනෙන් උපුටාගත් කොටසකි.

**පුනරුත්පාදනය නමැති ඩෝවනයෙන් ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ අලුත් කිරීමෙන් ද උන් වහන්සේ අප ගැලෙව් සේක.**

සියලු මනුෂ්‍යයන්ට ගැළවීම ගෙන දෙන දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය ප්‍රකාශ වී ඇත. අභක්තිය ද ලෞකික තෘෂ්ණා ද හැර දමා, ආශිර්වාද ලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන් වහන්සේගේ ද අපගේ ගලවුම්කාර

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ද තේජාන්විත ආගමනය ගැනත් බලා සිටිමින් සිහි නුවණින් යුතු ව ධර්මිෂ්ඨ ලෙසත් භක්තිවන්ත ලෙසත් මෙලොව ජීවත් වන පිණිස ඒ දේව වරප්‍රසාදය අපට අනුශාසනා කරන්නේ ය. සියලු අධර්මිෂ්ඨකම් වලින් අප පවිත්‍ර කරන පිණිසත්, අප උන් වහන්සේගේ තෝරා ගත් සෙනඟක් කරන පිණිසත්, යහපත කිරීමට අප උද්‍යෝගිමත් කරවන පිණිසත් අප නිදහස් කරන පිණිසත්, උන් වහන්සේ අප උදෙසා දිවි පිදූ සේක. එහෙත් අපගේ ගැළවුම්කාර දෙවියන් වහන්සේගේ ගුණවත්කම හා ප්‍රේමය මනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශ වූ කල, අප විසින් ම කළ දැහැමි ක්‍රියාවලින් නොව, හුදෙක් ස්වකීය දයාව ලෙස, පුනරුත්පාදනය නමැති ධෝවනයෙන් ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ අලුත් කිරීමෙන් ද උන් වහන්සේ අප ගැලෙව් සේක. උන් වහන්සේගේ වරප්‍රසාදයෙන් අප ධර්මිෂ්ඨ කරනු ලැබ, සදාතන ජීවනයේ බලාපොරොත්තුවට උරුමක්කාරයන් වන පිණිස, උන් වහන්සේ අප ගැළවුම්කාර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන ශුද්ධාත්මයාණන් අධික ලෙස අප පිට වැගිරෙව් සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ලූක් 3:16

ආලේලූයා! ආලේලූයා!
මම නම් ඔබ වතුරෙන් බව්තිස්ම ස්නාපනය කරමි.
එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේය.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 3:15-16, 21-22

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් පැමිණෙන්නා හ.**
**උන් වහන්සේ ඔබ ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන් ද, ස්නාපනය කරන සේක.**

"මේ ක්‍රිස්තුවරයා වියහැකි ද"යි සෙනඟ අපේක්ෂාවෙන් බලා සිටිය දීත්, හැම දෙන ජුවාම් ගැන විවාද කරමින් සිටිය දීත්, ජුවාම් සියල්ලන්ට පිළිතුරු දෙමින්, "මම නම් ඔබ වතුරෙන් බව්තිස්ම ස්නාපනය කරමි. එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේය. එතුමන්ගේ පාවහන් පටි මුදන්ට වත් මම නොවටිමි. එතුමාණෝ ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන් ද, ඔබ බව්තිස්ම ස්නාපනය කරවන සේක. තවද මුළු සෙනඟ බව්තිස්ම - ස්නාපනය ලැබූ විට, ජේසුස් වහන්සේත් බව්තිස්ම - ස්නාපනය ලබා යාච්ඤා කරමින් සිටියදී ස්වර්ගය විවර වී, ශුද්ධාත්මයාණෝ පරෙවියෙකුගේ රූපාකාරයෙන් උන්වහන්සේ කෙරෙහි පහළ වූ සේක. එවිට "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි"යි අහසින් හඬක් නික්මිණි.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.